## 170 – මගෙ ජීවනයම

මගෙ ජීවනයම ඔබවේ
ඔබ මගෙ රැකවරණය වේ
ගැලවුම් මාර්ගය සත්‍යය ඔබමයි
සැබැවයි සමිඳේ සැබැවයි

ආවේ ජීවනයම දෙන්නයි වැඩි වැඩියෙන් දෙන්නයි
සැමකල දිරිදෙන ඔබ බලයයි මගේ දිවි ඔබ නතු වෙයි
ඔබ ඇති අය වෙත ජීවනයයි නැති අය වෙත මරණේ
නොබියව නොසැලි සිටිනට සැම කල්
කැඳවනු මගේ නම කියලා

ජලයේ මැදිනා යන කලටා ඇත මට ඔබ පිහිටා
මැදිනා යන කල මහ ගංගා නොගලයි මා උඩිනා
ගිනි මැද යන කල මා නොදැවේ
ගිනිදැල් තොම ඇවිලේ
ඔබ මගේ දෙවි වේ බිය සැක නොදැනේ
තුතිවේ සමිඳේ තුති වේ

සව්ලෝ සතුනට සෙත දෙන්නයි
කිතු සිත පතුරන්නයි
ජීවන ජලයෙන් නහවන්නයි රැකවරණය දෙන්නයි
ගැලැවුම් මාර්ගය සලසන්නයි
පිළිතුර ඔබ වෙන්නයි
ම'පැතුම එය වේ ඔබ ඉටු දෙව්වේ
තුති වේ සමිඳේ තුති වේ